රහසිගතයි.

# විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

## අමාත්‍ය මණ්ඩල සංදේශය

සංදේශ අංකය [illegible]     ගොනු අංකය [illegible]

### අමාත්‍ය මණ්ඩල සටහන.

**හරිත බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2892/2893 (SF)- SRI ණය ගිවිසුම සඳහා වලංගු කාල සීමාව දිගු කිරීම සඳහා ඉල්ලීම.**

1.0. පසුබිම :

පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන පහත ණය අරමුදල් ආසියානු සංවර්ධන බැංකුව මඟින් 2012.09.18 දින අනුමත කරන ලද අතර 2013.09.30 දින සිට වලංගු (effective) වේ.

I. ණය අංක 2892 - SRI ආසියානු සංවර්ධන බැංකුවේ පොදු ප්‍රාග්ධන සම්පත් අරමුදලින් ඇමරිකානු ඩොලර් 100,000,000 සඳහා

II. ණය අංක 2893- SRI ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ මූල්‍ය සම්පත් වලින් විශේෂ භාර ගිණුම් ඒකක වලින් (special drawing Rights) SDR 19.994.000 සඳහා

මෙම ණය අරමුදල් ලබා ගැනීම සඳහා ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කල 2012.07.25 දැනැති අමාත්‍යමණ්ඩල සංදේශයේ කරුණු සැලකිල්ලට ගෙන(ඇමුණුම I) 2012.07.25 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය මඟින් (ඇමුණුම II) අනුමැතිය ලබා දී ඇත.

මෙම ණය අරමුදල් දෙකම අවසන් වීමේ දිනය 2017.06.30 දින වේ. මෙම ව්‍යාපෘතිය යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

a) පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 1 වන පැකේජය (මන්නාරම සම්ප්‍රේෂණ යටිතල පහසුකම්)

Lot A - කි.වොට්.132 / 33 මන්නාරම ග්‍රිඩ් උපපොල ඉදිකිරීම.

Lot B - අනුරාධපුර සිට වවුනියා දක්වා කි.මී.55 ක ඉදිකිරීම ද්විත්ව පරිපථ, twin zebra, කි.වොට්.220 නව සම්ප්‍රේෂණ මාර්ගය සහ වවුනියා සිට මන්නාරම දක්වා කි.මී.70, ද්විත්ව පරිපථ, single zebra. කි.වොට්.220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම

b) පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2 වන පැකේජය (කි.වොට්.132 සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ඉදිකිරීම)

Lot A – කෑගල්ල කි.වොට්.132 / 33 ග්‍රිඩ් උප පොල ඉදිකිරීම හා කුල්හිරිය කි.වොට්.132 / 33 ග්‍රිඩ් පොල වැඩි දියුණු කිරීම

Lot B – බියගම, සපුගස්කන්ද, පැරණි කොලොන්නාව, නව කොලොන්නාව, ඉහාරණ, පන්නල හා බෝල්වත්ත ග්‍රිඩ් උපපොලවල් වල breaker switched capacitors ඉදිකිරීම.

Lot C – කුල්හිරිය සිට කෑගල්ල දක්වා, කි.මී.24, ද්විත්ව පරිපථ, single zebra කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගය සඳහා ඉදිකිරීම; පොල්පිටිය සිට නව පොල්පිටිය කි.මී.1.5 ද්විත්ව පරිපථ, twin zebra කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගය සඳහා ද; අතුරුගිරිය සිට පාදුක්ක, කි.මී. 10, ද්විත්ව පරිපථ, twin zebra, කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගය සඳහා ද; සහ කොලොන්නාව කි.මී.15, කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ගොඩනැගීම.

c) පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - පැකේජය 3 (220kV සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ඉදිකිරීම)

Lot A – නව පොල්පිටිය කි.වෝ.220/132 / 33 ග්‍රිඩ් උප පොල සහ පාදුක්ක කි.වෝ.220/132 / 33 ග්‍රිඩ්උප පොල, සහ පන්නිපිටිය ග්‍රිඩ් උපපොල වැඩි දියුණු කිරීම.

Lot B – පාදුක්ක හරහා නව පොල්පිටිය - පන්නිපිටිය ඉදිකිරීම, කි.මී. 69.2, ද්විත්ව පරිපථ, twin zebra, කි.වෝ 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම

d) පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - පැකේජය 4 (මධ්‍යම වෝල්ටීයතා ජාල බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම)

Lot A – වවුනියාව - කැබිතිගොල්ලෑව කි.මී. 23, කි.වෝ. 33 කුළුණු මාර්ගය හා කැබිතිගොල්ලෑව කි.වෝ.33 ගැන්ට්‍රිය සහ නව අනුරාධපුර කහටගස්දිගිලිය කි.මී.33 ක් දිගැති කි.වෝ. 33 රැහැන් මාර්ගය කි.වෝ. 33 කහටගස්දිගිලිය ගැන්ට්‍රිය සමග ඉදිකිරීම.

Lot B - කි.මී 15 දිගැති කිරිබත්කුඹුර - ගලහ කි.වෝ. 33 කුළුණු මාර්ගය සහ ගලහ කි.වෝ. 33 ගැන්ට්‍රිය, ගල්මඩු හන්දිය සිට අක්කරෙයිපත්තුව, කි.මී 16 දිගැති කි.වෝ. 33 කුළුණු මාර්ගය සහ ගැන්ට්‍රිය; සහ අක්කරෙයිපත්තු - පොතුවිල්, කි.මී 42 දිගැති කි.වෝ. 33 කුළුණු මාර්ගය සහ පොතුවිල් කි.වෝ. 33 ගැන්ට්‍රිය ඉදිකිරීම.

## 2.0. විස්තරය

ඉහත ණය අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වල එක් එක් උප ව්‍යාපෘති වල කොන්ත්‍රාත් පහත පරිදි අත්සන් කර ක්‍රියාත්මක වේ.

I. 1 වන පැකේජය Lot දෙකක් ඇත. Lot A හා Lot B කොන්ත්‍රාත්හි බලාත්මක දිනයන් 22/04/2015 හා 05/05/2015 වේ.

II. 2 වන පැකේජය Lot තුනක් ඇත. Lot A, Lot B හා Lot C කොන්ත්‍රාත් වල බලාත්මක දිනයන් පිළිවෙළින් 01/01/2015, 01/04/2015 හා 01/02/2015 වේ.

III. 3 වන පැකේජය Lot දෙකක් ඇත. Lot A හා Lot B කොන්ත්‍රාත්හි බලාත්මක දිනයන් පිළිවෙළින් 26/05/2015 හා 26/06/2015 වේ.

IV. 4 වන පැකේජය Lot දෙකක් ඇත. Lot A හා Lot B කොන්ත්‍රාත්හි බලාත්මක දින 06/06/2015 වේ. මේ සියලු කොන්ත්‍රාත් හි කාලය 2017 ජුනි අවසන් වේ.

කෙසේ නමුත් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී බලාත්මක වූ දින සිට වර්ෂ දෙකක් ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වේ. එමෙන්ම මෙම කොන්ත්‍රාත් යටතේ දින 540 ක වගකීම් කාලයක් (defect liability) කාලයක් සහ *force majeure* කාලය දික් කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. මෙම කොන්ත්‍රාත් ආරම්භ කිරීමෙන් පසු ඇතිවූ අවශ්‍යතාව මතආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ද ඇතිව පහත සඳහන් ලොට් වල වෙනස්කම් සිදුකර ඇත.

<u>පැකේජය 01- Lot A</u>

කි.වෝ.. 220 / 33 මෙගා වෝල්ට් ඇම්පියර් 45, තාරාපැවි, සහ මන්නාරම උපපොළ එක් කි.වෝ. 132 / 33 මෙගා වෝල්ට් ඇම්පියර් 31.545 තාරාපැවි, කොන්ත්‍රාත් විෂය පථය සිට වවුනියාව උපපොළ කි.වෝ. 2x132 සම්ප්‍රේෂණ මාර්ගය එකතුවීමෙන්.

<u>පැකේජය 02- Lot A</u>

කුලියාපිටිය උපපොළ කි.වෝ.132 ගැන්ට්‍රි වෙනස් කිරීම.

<u>පැකේජය 03- Lot A</u>

නව පොල්පිටිය උපපොළ අමතර කි.වෝ.. 220 මාර්ග දෙකක් ඉදි කිරීම; නව අනුරාධපුර උපපොළ කි.වෝ 220. මාර්ගය බේ දෙකක් සඳහා උපකරණ මිලදී ගැනීම, අමතර තනි අදියර කි.වෝ 220 / 132 මෙගා වෝල්ට් ඇම්පියර් 250 / 3 තාරාපැවි ඒකක දෙකක් මිලදී ගැනීම.

එබැවින් ඉහත තත්ත්වය සලකා බලා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගෙන ඇති ණය අරමුදල් වල වලංගු කාලය 2017.06.30 දින සිට තවත් මාස 40ක කාලයකින් දිගු කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. එසේ වලංගු කාලය දිගු කර ගැනීමට නොහැකි වුවහොත් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජයේ අරමුදල් භාවිතයට ගැනීමට සිදු වේ. එය පවතින මූල්‍යමය තත්ත්වය තුල ප්‍රායෝගික දුෂ්කරතාවයන් මතු කල හැකිය.

3.0. යෝජනා

ඉහත කරුණු සැලකිල්ලට ගෙන ආසියානු සංවර්ධණ බැංකුව සමඟ අත්සන් කොට ඇති පිවිතුරු බලශක්ති හා ජාල ණය අංක 2892/2893 (SF)- SRI වලංගු කාලය 2017.06.30 දින සිට තවත් මාස 40 ක කාලයකින් දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලට යෝජනා කරමි.

4.0. අනුමැතිය

ඉහත 3.0 යෝජනාව සඳහා අනුමැතිය පතමි.

රංජිත් සියඹලාපිටිය
**විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය**

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය
අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත
කොළඹ 07.

2017 ජුනි මස 13 දින.